# ආර්ථික විද්‍යාව

## 10.4 : විදේශ ආයෝජනය රටක ආර්ථිකයට බලපාන ආකාරය

**විදේශ ආයෝජනය**

රටක්, ආයතනයක් හෝ පුද්ගලයකු හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිල දී ගැනීම හෝ තම ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාරවල කොටස් වැඩි සංඛ්‍යාවක් මිල දී ගැනීම විදේශ ආයෝජනයයි.

විදේශ ආයෝජනය ප්‍රධාන කොටස් දෙකකි.

1. ඍජු විදේශ ආයෝජන
2. කළඹ විදේශ ආයෝජන

**ඍජු විදේශීය ආයෝජන**

ඍජු විදේශ ආයෝජන යනු කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය රටක එලදායි මූර්ත වත්කම් අත්පත් කර ගැනීම යි.

**නිදසුන්** : කර්මාන්ත ශාලා, පතල්, ඉඩකඩම් ආදී වත්කම් විදේශීය ආයෝජකයන් අත්පත් කර ගැනීම
කිසියම් වර්ෂයක් විදේශ ඍජු ආයෝජන ඇස්තමේන්තු කිරීමේ දී රට තුළට ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහයන් හා රටින් පිටතට ගලා යන ප්‍රාග්ධනය යන දෙක ම සැලකිල්ලට ගැනේ.

විදේශීය ඍජු ආයෝජන පිළිබඳ ව මෑත කාලීන ප්‍රවණතා

– පොළී අනුපාතිකය මෑත වර්ෂවල වැඩි වීමේ ස්වභාවයක් පෙන්නුම් කිරිම නිසා ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් නැගී එන ආර්ථිකයන්ට දැඩි බලපෑමක් එල්ල වීම
– ආයෝජකයන් නැගී එන වෙළෙඳපොළ ආර්ථිකය තුළ ආයෝජනය කිරීමට මැලි වීම

## ඍජු ආයෝජනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක

- විදේශ ආයෝජන තුළින් ශක්තිමත් වන ජාත්‍යන්තර සාධක සංචලතාව හේතු කොට ගෙන සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉහළ යාම
- අමතර ප්‍රාග්ධන ප්‍රවාහයන් රට තුළට ගලා ඒම තුළින් සම්පත් පරිහරණය (ඉතුරුම්-ආයෝජන) පියවා ගැනීමට හැකි වීම
- විදේශ විනිමය පරතරය පියවා ගැනීමට හැකි වීම (විදේශීය ලැබීම් - විදේශීය ගෙවීම් - අපනයන පරතරය)
- ගෙවුම් ශේෂ හිඟයට පිළිතුරක් වීම
- ණය බර ඉහළ නොයාම
- නව තාක්ෂණය හා කළමනාකරණය රටට ලබා ගත හැකි වීම
- ලාභාංශ හා පොළී වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් පිටරටට ඇදී යාම
- දේශීය ආර්ථික කටයුතුවලට අයහපත් බලපෑම් ඇති වීම
- ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ශිල්පීය ක්‍රම භාවිතය නිසා රැකියා අවස්ථා අහිමි වීම
- ස්වභාවික සම්පත් අධිපරිභෝජනයට ලක් වීම
- දේශීය කර්මාන්ත අඩපණ වීම
- රජයට ලැබෙන බදු ආදායම් නියම ලෙස නොලැබී යාම
- දේශීය ආයෝජකයන් සඳහා ඇති මුදල් විදේශ ව්‍යාපාර වෙත ඇදී යාම
- දේශීය ව්‍යාපාරවල දක්ෂ සේවකයන් විදේශ ව්‍යාපාර කරා යාම.

## කළඹ විදේශ ආයෝජනය

කළඹ විදේශ ආයෝජනය යන්නෙන් අදහස් වන්නේ මූල්‍ය ප්‍රතිලාභයන් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස් පිළිණපත්, ණයකර, වාණිජ පත්‍රිකා ආදි මූල්‍ය වෙළෙඳපොළ උපකරණ මිල දී ගැනීම යි. කළඹ විදේශ අයෝජනවල දී ආයෝජකයන්ට විදේශ ව්‍යාපාරයන්ගේ කළමනාකාරීත්වය හිමිකම හෝ පාලනය හෝ පිළිබඳ හිමිකමක් නොලැබෙනු ඇත.

කළඹ ආයෝජනයේ වාසි

- විදේශ විනිමය ලැබීම
- ගෙවුම් ශේෂය යහපත් වීම
- විනිමය අනුපාතිකය ශක්තිමත් වීම

කළඹ ආයෝජනයේ අවාසි

- විදේශ ප්‍රාග්ධනය ක්ෂණිකව ආපසු රැගෙන යාම
- සත්කාරක රටේ ආර්ථිකය ගැන උනන්දුවක් නොදැක්වීම.
- ආර්ථිකය දැඩි අස්ථායීතාවයකට පත්වීම

කළඹ ආයොජනයේ මෑත කාලීන ප්‍රවණතා

- මෑත වර්වල හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජනය අඩු වීමක් පෙන්නුම් කිරීම

- රටෙහි පවතින දේශපාලන අස්ථාවරභාවය මත විදේශ අංශ කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීම මන්දගාමී ස්වරූපයක් දක්වීම

- කොටස් වෙළෙඳපොළ අස්ථාවරත්වය දිගට ම අඛණ්ඩ ව පැවතීම හේතුවෙන් ආයෝජකයන් ආයෝජනයට මැළි වීම පෙන්නුම් කිරීම

- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කරනු ලබන සීමා හා ක්ෂේත්‍ර පුළුල් කිරීම හරහා රජයේ ප්‍රතිපත්ති හා සමගාමී ව ආණ්ඩුවේ ආයෝජන ප්‍රතිපත්ති නැවත සමාලෝචනය කිරීම